# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,816 - 2013 ජුනි මස 21 වැනි සිකුරාදා - 2013.06.21**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස : I වැනි ඡෙදය - සාමාන්‍ය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය | — | රජයේ නිවේදන ... ... ... | 504 |
| ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | 498 | මිල පාලන දැන්වීම් ... ... ... | — |
| අමාත්‍ය මණ්ඩලය විසින් කරන ලද පත්කිරීම් ආදිය ... | –– | ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම් ... ... ... | — |
| රාජ්‍ය සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ශ්‍රී ලංකාණ්ඩුවේ ගිණුම් ප්‍රකාශන ... ... ... | — |
| අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කරන ලද පත්කිරීම් ආදිය | — | ආදායම් හා වියදම් පිළිබඳ වාර්තා ... ... ... | — |
| වෙනත් පත්කිරීම් ආදිය ... ... ... ... | 504 | විවිධ දෙපාර්තමේන්තු දැන්වීම් ... ... ... | 509 |
| රෙජිස්ට්‍රාර්වරුන්ගේ පත්කිරීම් ආදිය ... ... ... | — | නැවියන්ට දැන්වීම් ... ... ... | — |
| | | සුරාබදු ආඥාපනත පිළිබඳ දැන්වීම් ... ... ... | — |


*සැ. යු.*- (i) ජයන්තිපුර සුහසාධක සංගමය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 මැයි මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී;

(ii) පිය දසුන පදනම (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 මැයි මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී;

(iii) ස්වාභිමානී දහම් සවිය (සංස්ථාගත කිරීමේ) පනත් කෙටුම්පත 2011 මැයි මස 27 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II* වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳ ව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාර ගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳ ව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳ ව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2013 ජූලි මස 12 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2013 ජුනි මස 28 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**පී. එච්. එල්. වී. ද සිල්වා,**
රජයේ මුද්‍රණාලයාධිපති (*වැ. බ.*).

2013 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# ජනාධිපතිතුමාණන් විසින් කරන ලද පත්කිරීම් ආදිය

2013 අංක 208

MOD/DEF/2/01/ENL/03/ORC.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද
අධිකාරියට පත් කිරීම්

පහත නම් සඳහන් බලලත් නිලධාරීන් 2013 පෙබරවාරි මස 15 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ ලුතිතන් (උපකරණ පාලක) නිලධාරීන් වශයෙන් පහත දක්වා ඇති ජ්‍යෝෂ්ඨතා පිළිවෙලට අනුව අධිකාරියට පත්කිරීම සහ එම දින සිට ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති රෙජිමේන්තු/බළකා වෙත ඇතුළත් කිරීම අනුමත කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ.

1. සෙ/401770 බලලත් නිලධාරි I බස්නායක මුදියන්සේලාගේ සිරිපාල, ගැමුණු හේවා බලකාය
2. සෙ/151113 බලලත් නිලධාරි I වික්‍රම ආරච්චිගේ සුමිත් මනතුංග වික්‍රමාරච්චි, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව
3. සෙ/353606 බලලත් නිලධාරි I රූපසිංහ සිරිවර්ධනගේ උපුල් සිරිවර්ධන යූඑස්පී, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
4. සෙ/675404 බලලත් නිලධාරි I මාතොටගේ අරුණ නිශාන්ත, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් සේවා බලකාය
5. සෙ/240449 බලලත් නිලධාරි I මද්දුම හේවාගේ උපුල් නන්දන, ශ්‍රී ලංකා ඉංජිනේරු බලකාය
6. සෙ/775824 බලලත් නිලධාරි I දිසානායක මුදියන්සේලාගේ තලාකුඹුරේ ගෙදර ටයිනිස් නිශාන්ත, සන්නද්ධ බුද්ධි බළකාය
7. සෙ/700370 බලලත් නිලධාරි I බස්නායක මුදියන්සේලාගේ රංජිත් ප්‍රියන්ත බස්නායක, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය
8. සෙ/650186 බලලත් නිලධාරි I තෙන්නකෝන් මුදියන්සේලාගේ අනුරුද්ධ තෙන්නකෝන්, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය
9. සෙ/151444 බලලත් නිලධාරි I පත්තිනිය දූරගේ සුජිත් නිරෝෂන්, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව
10. සෙ/106888 බලලත් නිලධාරි I වර්ෂමාන දේවයලාගේ සමන් සිසිර කුමාර, විශේෂ බලකාය
11. සෙ/103111 බලලත් නිලධාරි I වීසිරි මුදියන්සේලාගේ සමන්ත කුමාර, ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකාය
12. සෙ/503074 බලලත් නිලධාරි I දොඩම්පේ ගමගේ මනෝජ් නීල කුමාර පෙරේරා, විජයබාහු පාබල රෙජිමේන්තුව
13. සෙ/750399 බලලත් නිලධාරි I තැබෑරුමේ ගෙදර කරුණාරත්න උදය ජයලත්, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය
14. සෙ/453868 බලලත් නිලධාරි I හේරත් මුදියන්සේලාගේ අනුර රුවන් බණ්ඩාර හේරත්, ගජබා රෙජිමේන්තුව
15. සෙ/675412 බලලත් නිලධාරි I දෙනගම ගෙදර ගාමිණී, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බලකාය
16. සෙ/151070 බලලත් නිලධාරි I තෙන්නකෝන් මුදියන්සේලාගේ රත්නායක, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව
17. සෙ/150702 බලලත් නිලධාරි I කාලිංගගේ සරත් අමරසිංහ, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව
18. සෙ/700418 බලලත් නිලධාරි I ගරුමුනි නීල් සොයිසා, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය
19. සෙ/150770 බලලත් නිලධාරි I දෙනිපිටියගේ දොන් සමන්ත තුෂාර දෙනිපිටිය, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව
20. සෙ/775385 බලලත් නිලධාරි I මාරසිංහ ආරච්චිලාගේ රුවන් දිලීප මාරසිංහ, සන්නද්ධ බුද්ධි බළකාය
21. සෙ/458157 බලලත් නිලධාරි I හල්ලොලුව කංකානම්ගේ ශාන්ත පුෂ්පකුමාර, විශේෂ බලකාය
22. සෙ/359456 බලලත් නිලධාරි I දොඩම්ගොඩගේ දොන් ප්‍රදීප් කුමාර, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
23. සෙ/650099 බලලත් නිලධාරි I කංකානම්ගේ මර්වින් ආනන්ද, ශ්‍රී ලංකා යුද්ධ හමුදා වෛද්‍ය බලකාය
24. සෙ/750293 බලලත් නිලධාරි I වන්නිආරච්චිගේ වජ්ජපානී චින්තන, ශ්‍රී ලංකා ඉංජිනේරු සේවා බලකාය
25. සෙ/401541 බලලත් නිලධාරි I සායක්කාරගේ උපුල් පුෂ්පකුමාර ගැමුණු හේවා බලකාය
26. සෙ/452761 බලලත් නිලධාරි I තෙවරප් පෙරුමලාගේ අජිත් ජානක, ගජබා රෙජිමේන්තුව
27. සෙ/410203 බලලත් නිලධාරි I පල්ලේවත්තේ අවල යෙහෙන් ප්‍රසන්න, ගැමුණු හේවා බලකාය
28. සෙ/353393 බලලත් නිලධාරි I මෙරගල් පේඩි ගෙදර ප්‍රියන්ත කුමාර සඳසිරි, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
29. සෙ/700369 බලලත් නිලධාරි I දියාලගොඩ පතිරන්නැහේලාගේ ප්‍රේමලාල් සෝමතිලක, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බලකාය
30. සෙ/575917 බලලත් නිලධාරි I වීරසේකර මුදියන්සේලාගේ සුසන්ත ප්‍රියදර්ශන වීරසේකර, ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බලකාය
31. සෙ/305355 බලලත් නිලධාරි I බාලසූරිය මුදියන්සේලාගේ උපුල් චන්දන බාලසූරිය, විශේෂ බලකාය
32. සෙ/750298 බලලත් නිලධාරි I බොරළුවෙ විදානෙලාගේ බෝනිල් ජයකුමාර, ඉංජිනේරු සේවා බලකාය
33. සෙ/402960 බලලත් නිලධාරි I වීරසිංහ මුදියන්සේලාගේ රිටිගහවත්තේ ගෙදර සමන්ත වීරසිංහ, යූඑස්පී ගැමුණු හේවා බලකාය
34. සෙ/404376 බලලත් නිලධාරි I ජයසේකර විතානගේ ගාමිණී ජයන්ත, ගැමුණු හේවා බලකාය
35. සෙ/303848 බලලත් නිලධාරි I එගොඩවත්ත රාළලාගේ කරුණාතිලක බංඩාර, ශ්‍රී ලංකා පාබල හමුදාව
36. සෙ/353134 බලලත් නිලධාරි I ගනේගොඩ මුදියන්සේලාගේ ප්‍රේමරත්න, යූඑස්පී ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
37. සෙ/775848 බලලත් නිලධාරි I බන්නැක් ගෙදර සුසිල් ප්‍රියන්ත බණ්ඩාර, සන්නද්ධ බුද්ධි බලකාය
38. සෙ/600661 බලලත් නිලධාරි I මුණසිංහ රංජිත්, ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බලකාය
39. සෙ/402869 බලලත් නිලධාරි I හේවා පලිහක්කාරගේ අරුණ ශාන්ත, ගැමුණු හේවා බලකාය
40. සෙ/33234 බලලත් නිලධාරි I බංඩාගේ තිලකරත්න, යූඑස්පී ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
41. සෙ/456882 බලලත් නිලධාරි I දසනායක මුදියන්සෙලැගේ නැකැත් රාළලැ ගෙදර ලලිත් ප්‍රියන්ත දසනායක, ගජබා රෙජිමේන්තුව

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 මැයි මස 07 වැනි දින,
කොළඹ දී ය.

06-380

2013 අංක 209

DIRF/RECT/271/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම්

පහත නම් සඳහන් කෙඩෙට් නිලධාරීන් 2012.12.22 දින සිට දක්වා ඇති ජ්‍යෙෂ්ඨතා අනු පිළිවෙල අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවැනි ලුතිතන් නිලයෙන් අධිකාරියට පත් කරනු ලැබීම සහ එදින සිට ඔවුන්ගේ නම් ඉදිරියෙන් දක්වා ඇති රෙජිමේන්තු/බළකා වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ.

සී/58250 කෙඩෙට් නිලධාරි උඩුවරගේ ලහිරු මධුසංඛ සිල්වා, යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව
සී/58270 කෙඩෙට් නිලධාරි අබ්දුල් හසන් මොහොමඩ් ඛාන්, ගජබා රෙජිමේන්තුව
සී/58290 කෙඩෙට් නිලධාරි ප්‍රූඩ් නිලුක්ෂාන් වීරසූරිය, ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකාය
සී/58252 කෙඩෙට් නිලධාරි හේරත් මුදියන්සේලාගේ රුවන් ප්‍රියදර්ශන හේරත්, ශ්‍රී ලංකා ඉංජිනේරු බළකාය
සී/58265 කෙඩෙට් නිලධාරි ඇත්මඩලගේ ශ්‍රියාන් කල්ප රමේෂ් පෙරේරා, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව
සී/58070 කෙඩෙට් නිලධාරි ඒකනායක මුදියන්සේලාගේ නුවන් ධනංජය බණ්ඩාර ඒකනායක, ශ්‍රී ලංකා සංඥා බළකාය
සී/58279 කෙඩෙට් නිලධාරි දර්ශන උදය කුමාර ලොකුවැල්ලගේ, ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව
සී/58257 කෙඩෙට් නිලධාරි කැටිපෙ කංකානම්ගේ මහේෂ් නිරෝෂාන් කංකානම්ගේ, ගැමුණු හේවා බළකාය
සී/58268 කෙඩෙට් නිලධාරි ගජසිංහගේ කසුන් සම්පත් සිල්වා, විජයබාහු පාබල රෙජිමේන්තුව
සී/58280 කෙඩෙට් නිලධාරි මාවනාන හේවා චමිෂ මධුශාන් සිල්වා, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොලිස් හේවා බළකාය
සී/58247 කෙඩෙට් නිලධාරි වුලේන්ද්‍ර යසස්ශ්‍රී බංඩාර සේනාරත්න, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
සී/58296 කෙඩෙට් නිලධාරි තොටගේ ආර්නි පැන්ක් රජීව් සිල්වා, ශ්‍රී ලංකා යුද්ධ හමුදා සේවා බළකාය
සී/58097 කෙඩෙට් නිලධාරි කසුන් චතුරංග ගමගේ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා යුධෝපකරණ බළකාය
සී/58248 කෙඩෙට් නිලධාරි දෙමනගම්මන ගමඇතිගේ මාධව මහේෂ් සඳරුවන්, ශ්‍රී ලංකා පාබල හමුදාව
සී/58255 කෙඩෙට් නිලධාරි ඉම්හාමි මුදියන්සේලාගේ අරුණ ප්‍රියන්ත හේරත්, ශ්‍රී ලංකා යුද්ධ හමුදා පොදු සේවා බළකාය
සී/58095 කෙඩෙට් නිලධාරි රුබසිං සිරිවර්ධන විමුක්ති, ඉංජිනේරු සේවා බළකාය
සී/58254 කෙඩෙට් නිලධාරි අලවත්තේගම මඩුවේ ගෙදර මනෝජ් ගයාන් මධුවන්ත අලවත්තේගම, විජයබාහු පාබල රෙජිමේන්තුව
සී/58260 කෙඩෙට් නිලධාරි කුමාරගේ ඉන්දික කසුන් පෙරේරා, ගජබා රෙජිමේන්තුව
සී/58267 කෙඩෙට් නිලධාරි ගලගම ආරච්චිගේ දිලාන් ධනුෂ්ක අබේධීර, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
සී/58266 කෙඩෙට් නිලධාරි විමුක්ති කසුන් බංඩාර ඉමදුව, ශ්‍රී ලංකා ඉංජිනේරු බළකාය
සී/58274 කෙඩෙට් නිලධාරි දොඹගොඩ ලියනගේ නුවන් ප්‍රියදර්ශන ලියනගේ, ශ්‍රී ලංකා පාබල හමුදාව
සී/58273 කෙඩෙට් නිලධාරි සිරිවර්ධන සඳපාල ආරච්චිගේ ලහිරු මනෝජ් මධුවන්ත සිරිවර්ධන, ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බළකාය
සී/58289 කෙඩෙට් නිලධාරි රවිඳු ජගදීෂ නාරංගොඩ, ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව
සී/58282 කෙඩෙට් නිලධාරි රණසිංහගේ සමන් උදාර පින්තු රනසිංහ, ගැමුණු හේවා බළකාය
සී/58294 කෙඩෙට් නිලධාරි හිරිහාමි ආරච්චිලාගේ සඳුන් ක්‍රිෂාන්ත සිරිවර්ධන, විජයබාහු පාබල රෙජිමේන්තුව
සී/58281 කෙඩෙට් නිලධාරි රත්නායක කලුආරච්චිගේ චතුරංග ෆිලික්ස් රත්නායක, ශ්‍රී ලංකා පාබල හමුදාව
සී/58272 කෙඩෙට් නිලධාරි හර්ෂ ලලිත් හෙට්ටිආරච්චි, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
සී/58249 කෙඩෙට් නිලධාරි රණසිංහ ආරච්චිලාගේ රශ්මික එරන්ද දම්රුවන්, ගජබා රෙජිමේන්තුව
සී/57907 කෙඩෙට් නිලධාරි එපිට කුඹුරේ මුදුන්කොත් ගෙදර ධනුෂ්ක මංජුල විජේනායක, ගැමුණු හේවා බළකාය
සී/58094 කෙඩෙට් නිලධාරි අකිල විරාජ් මධුසංඛ ගුණතිලක, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
සී/58264 කෙඩෙට් නිලධාරි වර්ණකුලපටබැඳිගේ තරිඳු ගයාන් ලක්ශාන්ත, පෙරේරා ගජබා රෙජිමේන්තුව
සී/58276 කෙඩෙට් නිලධාරි රත්නායක මුදියාන්සේලාගේ ඉසුරු ශෂීක, විජයබාහු පාබල රෙජිමේන්තුව
සී/58275 කෙඩෙට් නිලධාරි කිරිබංඩාගේ විකුම් ශ්‍රී විජුත විශ්ව බංඩාර, ශ්‍රී ලංකා පාබල හමුදාව
සී/58096 කෙඩෙට් නිලධාරි දිසානායක මුදියන්සේලාගේ ලහිරු යොහාන් දිසානායක, ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව
සී/58278 කෙඩෙට් නිලධාරි උදේෂ් මධුශාන් හේරත්, ශ්‍රී ලංකා පාබල හමුදාව
සී/57883 කෙඩෙට් නිලධාරි වීරකෝන් අච්චිගේ මිහිලක චතුරංග වීරකෝන්, ගැමුණු හේවා බළකාය
සී/58288 කෙඩෙට් නිලධාරි අරුණ ධනුෂ්ක බණ්ඩාර අත්තනායක, විජයබාහු පාබල රෙජිමේන්තුව
සී/58269 කෙඩෙට් නිලධාරි ඒකනායක මුදියාන්සේලාගේ බුද්ධික නිමන්ත ඒකනායක, ගජබා රෙජිමේන්තුව

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 අප්‍රේල් මස 05 වැනි දින,
කොළඹ දී ය.

06-461

---

2013 අංක 210

MOD/DEF/02/01/ENL/02/LCDT.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්ථිර බල හමුදාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත්කිරීම්

පහත නම් සඳහන් කාන්තා කෙඩෙට් නිලධාරීන් 2012.12.22 දින සිට දක්වා ඇති ජ්‍යෙෂ්ඨතා අනු පිළිවෙල අනුව ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්ථිර බල හමුදාවේ දෙවැනි ලුතිතන් නිලයෙන් අධිකාරියට පත් කරනු ලැබීම සහ එදින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකාය වෙත ඇතුළත් කරනු ලැබීම අනුමත කිරීමට අතිගරු ජනාධිපති උතුමාණන් විසින් ප්‍රසාදය පළ කරනු ලැබ තිබේ.

සී/58897 කාන්තා කෙඩෙට් නිලධාරි මාරසිංහ මුදියන්සේලාගේ මනෝරි කෞශල්‍යා මාරසිංහ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකාය
සී/58896 කාන්තා කෙඩෙට් නිලධාරි මාතොට රාලලාගේ ඩිලානි පූර්නිකා, ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකාය
සී/58898 කාන්තා කෙඩෙට් නිලධාරි ගුරුගමගේ අශානි චතුරිකා කිත්සිරි, ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකාය
සී/58902 කාන්තා කෙඩෙට් නිලධාරි වික්‍රමසිංහ මුදියන්සේලාගේ භාග්‍යා සුභාෂණී වික්‍රමසිංහ, ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකාය
සී/58901 කාන්තා කෙඩෙට් නිලධාරි තිළිණි රංගිකා වික්‍රමආරච්චි ශ්‍රී ලංකා යුද්ධ හමුදා කාන්තා බළකාය

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 මැයි මස 09 වැනි දින,
කොළඹ දී ය.

06-383

---

MOD/DEF/07/01/AVF/WDL/32.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බළසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් නියම කරන ලද අධිකාරියෙන් ඉවත් කිරීමක්

පහත නම සඳහන් නිලධාරි 2012 මැයි මස 31 වන දින සිට ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බළසේනාවේ අධිකාරියෙන් ඉවත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් නියම කර ඇත.

කපිතාන් පල්ලත්තර විදාන ගමගේ සහන් චාමිකර ඉසේබ (නි/8302)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2012 නොවැම්බර් මස 06 වැනි දින,
කොළඹ දී ය.

06-569

---

DVF/RECT/278/63/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බළසේනාව**

අපකීර්ති සහගත ලෙස අධිකාරියෙන් ඉවත් කිරීම

පහත නම සඳහන් නිලධාරි 2010 ජුනි මස 15 වැනි දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්වේච්ඡා බලසේනාවෙන් අපකීර්ති සහගත ලෙස අධිකාරියෙන් ඉවත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

ලුතිතන් බුලත්සිංහලාගේ තිස්ස නික්සන් කුරේ ගරෙ (නි/4102)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2010 නොවැම්බර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

06-568

---

DVF/RECT/278/62/AY.

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බළසේනාව**

අපකීර්ති සහගත ලෙස අධිකාරියෙන් ඉවත් කිරීම

පහත නම සඳහන් නිලධාරි 2009 නොවැම්බර් මස 11 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා යුද්ධ හමුදාවේ ස්වේච්ඡා බලසේනාවෙන් අපකීර්ති සහගත ලෙස අධිකාරියෙන් ඉවත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කර ඇත.

දෙවන ලුතිතන් පමිතා මදාරා රත්නායක ශ්‍රීලයුකාබ (නි/5532)

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2010 නොවැම්බර් මස 11 වැනි දින,
කොළඹ දී ය.

06-570

---

2013 අංක 211

DIVF/RECT/66/AY(i).

**ශ්‍රී ලංකා යුද්ධ හමුදාව - ස්වේච්ඡා බළසේනාව**

අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම් හා ඇතුලත් කිරීම්

ශ්‍රී ලංකා යුද්ධ හමුදා ස්වේච්ඡා බලසේනාවේ පහත නම් සඳහන් කෙඩෙට් නිලධාරීන් 2010 දෙසැම්බර් මස 21 වන දින සිට දක්වා ඇති ජ්‍යෝෂ්ඨතා පිළිවෙලට අනුව දෙවන ලුතිතන් නිලයෙන් අධිකාරියට පත්කිරීම හා

එදිනම සිට දක්වා ඇති රෙජිමේන්තු/බලකා වෙත ඇතුලත් කිරීම අතිගරු ජනාධිපති උතුමාණන් විසින් අනුමත කරනු ලැබ ඇත.

අ. කෙඩෙට් නිලධාරී - මුතුගල ආරච්චිගේ ධනුෂ්ක නුවන් කුමාර (කෙනි/32539) ශ්‍රී ලංකා සංඥා බලකාය

ආ. කෙඩෙට් නිලධාරී - කිහිඹිය හෙට්ටිගේ කපිල නයනජිත් (කෙනි/32533) ශ්‍රී ලංකා යුධ හමුදා සේවා බලකාය

ඇ. කෙඩෙට් නිලධාරී - රන්කොත් ගෙදර සුරේන්ද්‍ර ශ්‍රීනාත් ජයවික්‍රම- (කෙනි/32565) සන්නද්ධ බුද්ධි බළකාය

ඈ. කෙඩෙට් නිලධාරී - හෙට්ටිගෙදර මුදියන්සේලාගේ චන්දිම හර්ෂ ප්‍රේමරත්න බණ්ඩාර (කෙනි/31896) ශ්‍රී ලංකා ඉංජිනේරු රෙජිමේන්තුව

ඉ. කෙඩෙට් නිලධාරී රන්කොත්ගෙදර චාමර නුවන් බුද්ධික රන්කොත්ගෙදර (කෙනි/32589) ශ්‍රී ලංකා පාබල හමුදාව

ඊ. කෙඩෙට් නිලධාරී කසුන් මධුසංඛ ගමගේ (කෙනි/32605) යාන්ත්‍රික පාබල රෙජිමේන්තුව

උ. කෙඩෙට් නිලධාරී වික්‍රම ආරච්චිගේ උදිත පුෂ්ප කුමාර (කෙනි/32570) ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව

ඌ. කෙඩෙට් නිලධාරී විමලසූරිය දොන් දුලාජ් රන්දික අබේරත්න (කෙනි/32540) ගැමුණු හේවා බලකාය

එ. කෙඩෙට් නිලධාරී ගංඇතිලාගේ අෂාන් සංජීව (කෙනි/32585) විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරු රෙජිමේන්තුව

ඒ. කෙඩෙට් නිලධාරී හේරත් මුදියන්සේලාගේ රජීව් ප්‍රසන්න බණ්ඩාර හේරත් (කෙනි/32571) ශ්‍රී ලංකා රයිෆල් බලකාය

ඔ. කෙඩෙට් නිලධාරී මහප්පුගේ අරුණ සංජීව කරුණාරත්න (කෙනි/32578) ශ්‍රී ලංකා යුධ හමුදා පුරෝගාමී බලකාය

ඕ. කෙඩෙට් නිලධාරී අප්පුහාමිගේ නිස්සංක රත්නායක (කෙනි/32545) ගජබා රෙජිමේන්තුව

ක. කෙඩෙට් නිලධාරී හේරත් මුදියන්සේලාගේ චමින්ද රුවන් කුමාර හේරත් (කෙනි/32580) විජයබාහු පාබල රෙජිමේන්තුව

ග. කෙඩෙට් නිලධාරී මහදුරගේ හර්ෂන් ජීවකුමාර් (කෙනි/31999) ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව

ච. කෙඩෙට් නිලධාරී නැනතුංග ලියනගේ කාංචන ශ්‍යාමල් තිලකරත්න (කෙනි/32550) ශ්‍රී ලංකා සිංහ රෙජිමේන්තුව

ජ. කෙඩෙට් නිලධාරී පේදුරු ආරච්චිගේ ඉන්දික සනත් සිරිවර්ධන (කෙනි/32590) ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය

ට. කෙඩෙට් නිලධාරී දිසානායක මුදියන්සේලාගේ ජනක නුවන් අබේකෝන් (කෙනි/32567) ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව

ඩ. කෙඩෙට් නිලධාරී සන්දරාදුර යුරේෂ් රංගන සිල්වා (කෙනි/32553) ශ්‍රී ලංකා යුධ හමුදා යුධෝපකරණ බලකාය

ණ. කෙඩෙට් නිලධාරී හරේෂ් කසුන් පණ්ඩිතරත්න (කෙනි/32561) ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව

ත. කෙඩෙට් නිලධාරී ඉසුරු ගයාන් හෙට්ටිඅරච්චි (කෙනි/32602) ගැමුණු හේවා බලකාය

ද. කෙඩෙට් නිලධාරී විජේසේකර මුදියන්සේලාගේ අනුෂ උදයංග විජේසේකර (කෙනි/32592) ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව

න. කෙඩෙට් නිලධාරී අරුමා යමන් සමීර සම්පත් සේනක (කෙනි/32557) ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව

ප. කෙඩෙට් නිලධාරී ජනක සම්පත් වනිගසේකර (කෙනි/32562) ශ්‍රී ලංකා කාලතුවක්කු හමුදාව

බ. කෙඩෙට් නිලධාරී නුවන් දීපාල් විජේසිංහ (කෙනි/32595) ගජබා රෙජිමේන්තුව

ම. කෙඩෙට් නිලධාරී සමරකෝන් මුදියන්සේලාගේ ලීන් ප්‍රදීප් බණ්ඩාර සමරකෝන් (කෙනි/32579) ශ්‍රී ලංකා යුධ හමුදා පොදු සේවා බලකාය

ය. කෙඩෙට් නිලධාරී කොටිකාබද්දයැලෑ ගෙදර ප්‍රනීත් ධනංජය කුමාර (කෙනි/32541) ශ්‍රී ලංකා ඉංජිනේරු රෙජිමේන්තුව

ර. කෙඩෙට් නිලධාරී අතපත්තු මුදියන්සේලාගේ ජගත් චන්ද්‍ර බණ්ඩාර අතපත්තු (කෙනි/32574) විජයබාහු පාබල රෙජිමේන්තුව

ල. කෙඩෙට් නිලධාරී වැල්ලවත්ත ආරච්චිගේ හසන්ත ධනුෂ්ක සිල්වා (කෙනි/32586) ශ්‍රී ලංකා පාබල හමුදාව

ව. කෙඩෙට් නිලධාරී ඒකනායක මුදියන්සේලාගේ මලින්ද පුබුදු කුමාර ඒකනායක (කෙනි/32587) ශ්‍රී ලංකා රයිෆල් බලකාය

ස. කෙඩෙට් නිලධාරී රත්නායක මුදියන්සේලාගේ මහේෂ් ධම්මික (කෙනි/32569) ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව

හ. කෙඩෙට් නිලධාරී දියගම ලියනගේ දොන් ක්‍රිෂාන් සමීර (කෙනි/32600) ඉංජිනේරු සේවා බලකාය

ළ. කෙඩෙට් නිලධාරී අත්තනායක මුදියන්සේලාගේ ප්‍රදීප් ධනන්ජය අත්තනායක (කෙනි/32563) ශ්‍රී ලංකා යුධ හමුදා පුරෝගාමී බලකාය

අඅ. කෙඩෙට් නිලධාරී විජේපාල අබේසිංහ මුදියන්සේලාගේ ප්‍රභාත් චතුරංග (කෙනි/32575) විජයබාහු පාබල රෙජිමේන්තුව

අආ. කෙඩෙට් නිලධාරී හබරකඩගේ ප්‍රසන්න අනුරංග (කෙනි/32551) ගජබා රෙජිමේන්තුව

අඇ. කෙඩෙට් නිලධාරී දිසානායක මුදියන්සේලාගේ ලහිරු ශාමික බංඩාර (කෙනි/32560) ගැමුණු හේවා බලකාය

අඈ. කෙඩෙට් නිලධාරී තුසිත ලක්මිණ ද සිල්වා මුණසිංහ (කෙනි/32594) ශ්‍රී ලංකා රයිෆල් බලකාය

අඉ. කෙඩෙට් නිලධාරී මහදුවගේ සුරේස් ධම්මික සමරසිංහ (කෙනි/32537) ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව

අඊ. කෙඩෙට් නිලධාරී සට්ටම්බි මාලන් ශ්‍යාමින්ද (කෙනි/32542) ශ්‍රී ලංකා පාබල හමුදාව

අඋ. කෙඩෙට් නිලධාරී ඩයන් චතුරංග විජේසිංහ (කෙනි/32604) ගැමුණු හේවා බලකාය

අඌ. කෙඩෙට් නිලධාරී මනුවෙල් අප්පු ශෂික රන්දුල මද්දුමගේ (කෙනි/32601) ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව

අඑ. කෙඩෙට් නිලධාරී කුරුප්පු ආරච්චිලාගේ ඉසුරු ප්‍රසාද් කුරුප්පු ආරච්චි (කෙනි/32582) ගජබා රෙජිමේන්තුව

අඒ. කෙඩෙට් නිලධාරී ඉලංගකෝන් මුදියන්සේලාගේ දිල්හාන් දුෂ්‍යන්ත බණ්ඩාර ඉලංගකෝන් (කෙනි/32558) ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය

අඔ. කෙඩෙට් නිලධාරී පරාක්‍රම සිංහගේ ලසන්ත තිලකසිරි (කෙනි/32547) ගැමුණු හේවා බලකාය

අඕ. කෙඩෙට් නිලධාරී කෝන්ගහ වත්තගේ දිලාන් ප්‍රියන්ත (කෙනි/32052) ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව

අක. කෙඩෙට් නිලධාරී ගබඩා රාලලාගේ නීල් සාලිය බංඩාර (කෙනි/32576) ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව

අග. කෙඩෙට් නිලධාරී ගලප්පත්තිගේ ජනක චමිත් ද සිල්වා (කෙනි/32568) ගැමුණු හේවා බලකාය

අච. කෙඩෙට් නිලධාරී කාන්කානි තන්ත්‍රි නුවන් මිහිර සිල්වා (කෙනි/32588) ශ්‍රී ලංකා සන්නාහ සන්නද්ධ බලකාය

අජ. කෙඩෙට් නිලධාරී ජයසිංහ පතිරණගේ තිළිණ සුදර්ශන ජයසිංහ (කෙනි/32597) ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව

අට. කෙඩෙට් නිලධාරී මැට්වල තිවන්ක මහේෂ් (කෙනි/32564) ගැමුණු හේවා බලකාය

අඩ. කෙඩෙට් නිලධාරී වීරසූරිය ආරච්චිලාගේ මනෝජ් ධම්මික බණ්ඩාර (කෙනි/32549) ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුළුව

අණ. කෙඩෙට් නිලධාරී විතාන තන්තිරිගේ සඳුන් මධුසංඛ ගුණතිලක (කෙනි/32577) ශ්‍රී ලංකා රයිෆල් බලකාය

අත. කෙඩෙට් නිලධාරී වර්ණසූරිය මුදියන්සේලාගේ උදය කුමාරසිරි (කෙනි/31989) ගජබා රෙජිමේන්තුව

අද. කෙඩෙට් නිලධාරී පුස්සෙවෙල කංකානම්ගේ රංගන ලක්මාල් (කෙනි/32544) ශ්‍රී ලංකා ජාතික ආරක්ෂක බලමුලුව

අන. කෙඩෙට් නිලධාරී ගීකියනගේ චරිත් ඕෂදි සිරිවර්ධන (කෙනි/32591) විජයබාහු පාබල රෙජිමේන්තුව

අප. කෙඩෙට් නිලධාරී පණ්ඩිතරත්න වාසල මුදියන්සේ රාළහාමිලාගේ කනිෂ්ක (කෙනි/32598) ශ්‍රී ලංකා යුධ හමුදා යුධෝපකරණ බලකාය

අබ. කෙඩෙට් නිලධාරි රණසිංහ ආරච්චිගේ චමීර රසික (කෙනි/32566)
ශ්‍රී ලංකා පාබල හමුදාව

අතිගරු ජනාධිපති උතුමාණන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2011 ජූලි මස 27 වැනි දින,
කොළඹ දී ය.

06-458

---

2013 අංක 212

MOD/DEF/09/26/C/Lt. Col.

**ජාතික ශිෂ්‍යභට බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම්

*2013 අප්‍රේල් මස 01 වැනි දින සිට ලුතිතන් කර්නල් වශයෙන් :*

නි/3061 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) ඩීඑම්යූ දිසානායක
නි/3077 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) එච්ටී දෙව්පුර
නි/3131 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) එම් සුනිල් ශාන්ත
නි/3078 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) බීබීඑච් ප්‍රනාන්දු
නි/3045 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) බීපීජේ සුරවීර
නි/3620 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) කේපීයූ සමරසිංහ
නි/3624 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) කේජ්යූ සුරවීර
නි/3636 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) එච්ඩී ලාල් රවීන්ද්‍ර
නි/3644 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) ඩී නයිදූවාවඩු
නි/3774 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) ඩබ්එම්එන් විජේකෝන්
නි/3781 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) ආර්එම්වීපීබී හංගිලිපොල
නි/3803 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) එච්එම්එච් පිලපිටිය
නි/3811 මේජර් (තාවකාලික ලුතිතන් කර්නල්) ඒඑස්ජේ ද එස් ගුණරත්න

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 මැයි මස 09 වැනි දින,
කොළඹ දී ය.

06-382

2013 අංක 213

MOD/DEF/09/26/C/M.

**ජාතික ශිෂ්‍යභට බලකාය**

අතිගරු ජනාධිපතිතුමන් විසින් අනුමත කරන ලද නිල ස්ථිර කිරීම්

*2013 පෙබරවාරි මස 01 වැනි දින සිට මේජර් වශයෙන් :*

නි/4170 කපිතන් (තාවකාලික මේජර්) ඩීඩීසී වැලිකල
නි/4734 කපිතන් (තාවකාලික මේජර්) ටීඑච් අජිත්
නි/4166 කපිතන් (තාවකාලික මේජර්) ඩබ්එම් සෙනෙවි ශාන්ත
නි/4715 කපිතන් (තාවකාලික මේජර්) ජීඑස්ඩබ්ලිව් පීරිස්

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ ආර්ඩබ්පී ආර්එස්පී පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2013 මැයි මස 09 වැනි දින,
කොළඹ දී ය.

06-381

---

2013 අංක 214

D/RF/826/NY/01/01.

**ශ්‍රී ලංකා නාවික හමුදාව - ස්ථිර නාවික බලකාය**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද අධිකාරියට පත් කිරීම්

*2006 නොවැම්බර් මස 07 වැනි දින සිට වැඩ බලන උප ලුතිතන් වශයෙන් :*

1. මධ්‍ය නිලධාරි ඉමදුව වික්‍රම ආරච්චිගේ නුවන් ශ්‍රී මධුසංඛ එන්ආර්ඊ 2318 ශ්‍රීලංනාහ
2. මධ්‍ය නිලධාරි කලුඅප්පු කංකානමලාගේ දොන් මලින් දිලංක කරුණාරත්න එන්ආර්ඊ 2320, ශ්‍රීලංනාහ
3. මධ්‍ය නිලධාරි දිනිත් ඉරෝෂන නානායක්කාර, එන්ආර්ඊ 2321 ශ්‍රීලංනාහ
4. මධ්‍ය නිලධාරි ඉලන්දාරි දේව දිනේෂ් නිශංක එන්ආර්එල් 2322 ශ්‍රීලංනාහ
5. මධ්‍ය නිලධාරි බණ්ඩාරනායක මුදියන්සේලාගේ දර්ශන සම්පත් බණ්ඩාරනායක එන්ආර්ඊ 2323, ශ්‍රීලංනාහ
6. මධ්‍ය නිලධාරි හේවාවසම් වික්‍රමාරච්චිගේ ශාන්ත නිරෝෂන්, එන්ආර්එල් 2324, ශ්‍රීලංනාහ
7. මධ්‍ය නිලධාරි නම්මුනි විරාජ් ලක්ෂාන්ත ද සිල්වා, එන්ආර්ඊ 2327 ශ්‍රීලංනාහ
8. මධ්‍ය නිලධාරි සුබසිංහ ආරච්චිගේ නවීන් ප්‍රසාද් කරුණාරත්න එන්ආර්ඊ 2328, ශ්‍රීලංනාහ

9. මධ්‍ය නිලධාරී දීකිරි කැවගේ දොන් ප්‍රසාද් චාමර, එන්ආර්ඊ 2329, ශ්‍රීලංනාහ
10. මධ්‍ය නිලධාරී සුහසිංහ පතිරනලාගේ යාපා දොන් ජගත් සුහසිංහ, එන්ආර්ඊ 2331 ශ්‍රීලංනාහ
11. මධ්‍ය නිලධාරී ගම්ලත් රාල්ලාගේ ධම්මික සේනාධීර ගම්ලත්, එන්ආර්ඊ 2332, ශ්‍රීලංනාහ
12. මධ්‍ය නිලධාරී ගීගන ගමගේ දොන් නිසල ඉසුරු මුණසිංහ, එන්ආර්ඊ 2333, ශ්‍රීලංනාහ
13. මධ්‍ය නිලධාරී ඒකනායක මුදියන්සේලාගේ බුද්ධික ප්‍රසන්න ඒකනායක, එන්ආර්ඊ 2334, ශ්‍රීලංනාහ
14. මධ්‍ය නිලධාරී ජුනයිදීන් මොහොමඩ් දූෂාක්, එන්ආර්ඊ 2335, ශ්‍රීලංනාහ
15. මධ්‍ය නිලධාරී දිසානායක මුදියන්සේලාගේ ධනුෂ්ක මධුෂාන් දිසානායක එන්ආර්එක්ස් 2336, ශ්‍රීලංනාහ
16. මධ්‍ය නිලධාරී සුභ පන්ඩිත මුදියන්සේලාගේ නලීන් ජයතිලක, එන්ආර්එක්ස් 2337, ශ්‍රීලංනහ.
17. මධ්‍ය නිලධාරී මැණික් හවඩි විදානගේ සුජාන් දුලංජන මැණික්ගේ එන්ආර්එක්ස් 2341 ශ්‍රීලංනාහ
18. මධ්‍ය නිලධාරී සකලසූරිය මුදියන්සේලාගේ මන්ජුල ලසන්ත බණ්ඩාර සකලසූරිය එන්ආර්එක්ස් 2342, ශ්‍රීලංනාහ
19. මධ්‍ය නිලධාරී අන්සාර් මොහොමඩ් ෆයිසාල් එන්ආර්එක්ස් 2343 ශ්‍රීලංනාහ
20. මධ්‍ය නිලධාරී කොස්වින්නගේ ජනක ප්‍රසාද් රෝහණ, එන්ආර්එක්ස් 2344, ශ්‍රීලංනාහ

*2007 පෙබරවාරි මස 01 වැනි දින සිට වැඩ බලන උප ලුතිතන් වශයෙන්* :

21. මධ්‍ය නිලධාරී මේස්ත්‍රිගේ තිළිණ චාමර යෝගානන්ද ද සිල්වා එන්ආර්පී 1895, ශ්‍රීලංනාහ
22. මධ්‍ය නිලධාරී කෝදාගොඩ හිටිගේ හිරාන් එන්දික කෝදාගොඩ එන්ආර්පී 1896, ශ්‍රීලංනාහ
23. මධ්‍ය නිලධාරී සමරකෝන් මුදියන්සේලාගේ සම්පත් මංගල කරුණාරත්න, එන්ආර්එක්ස් 2242, ශ්‍රීලංනාහ

*2007 දෙසැම්බර් මස 19 වැනි දින සිට වැඩ බලන උප ලුතිතන් වශයෙන්* :

24. මධ්‍ය නිලධාරී දම්පහලගේ දොන් ළහිරු කාංචන දම්පහල, එන්ආර්එක්ස් 2348, ශ්‍රීලංනාහ
25. මධ්‍ය නිලධාරී වටගොඩ ගෙදර අසන්ත චන්ද්‍රපාල, එන්ආර්එක්ස් 2349, ශ්‍රීලංනාහ
26. මධ්‍ය නිලධාරී අරුණ කෝසල පතිරණ හේවගේ, එන්ආර්එක්ස් 2350 ශ්‍රීලංනාහ
27. මධ්‍ය නිලධාරී සජීව කිත්සර ජයවර්ධන, එන්ආර්එක්ස් 2352, ශ්‍රීලංනාහ
28. මධ්‍ය නිලධාරී පොන්වීර ආරච්චිලාගේ බුද්ධික කැලුම් රණසිංහ, එන්ආර්එක්ස් 2353 ශ්‍රීලංනාහ
29. මධ්‍ය නිලධාරී බෙන්තරගේ ඔෂධි මිගාර ප්‍රනාන්දු එන්ආර්එක්ස් 2354 ශ්‍රීලංනාහ
30. මධ්‍ය නිලධාරී වර්ණකුලසූරිය ඩිලාන් තිසේරා, එන්ආර්එක්ස් 2355, ශ්‍රීලංනාහ
31. මධ්‍ය නිලධාරී කරුනාමුනි සංඛ මධුෂාන් සිල්වා, එන්ආර්එක්ස් 2358, ශ්‍රීලංනාහ
32. මධ්‍ය නිලධාරී හේවා ජේඩිගේ උදයංග මංජුල කුමාර හේවාසිංහ, එන්ආර්එක්ස් 2359, ශ්‍රීලංනාහ
33. මධ්‍ය නිලධාරී මිරිහාගල්ල කංකානමලාගේ චානක සිරිවර්ධන, එන්ආර්එක්ස් 2360, ශ්‍රීලංනාහ
34. මධ්‍ය නිලධාරී සිංහපුර ගෙදර ඉසුරු සංජීව පින්නවල, එන්ආර්එක්ස් 2361, ශ්‍රීලංනාහ
35. මධ්‍ය නිලධාරී රණසිංහ හෙට්ටි ආරච්චිගේ සුරංග සම්පත් රණසිංහ, එන්ආර්එක්ස් 2362, ශ්‍රීලංනාහ
36. මධ්‍ය නිලධාරී රත්නායක මුදියන්සේලාගේ චතුරන්ග දේශප්‍රිය රත්නායක එන්ආර්එක්ස් 2363, ශ්‍රීලංනාහ
37. මධ්‍ය නිලධාරී ධනන්සූරිය ආරච්චිල්ලාගේ නිශාන්ත ධනන්සූරිය එන්ආර්එක්ස් 2364, ශ්‍රීලංනාහ
38. මධ්‍ය නිලධාරී විජේසිංහ දේවයලාගේ දිනේෂ් රවීන්ද්‍රලාල් විජේසිංහ, එන්ආර්එක්ස් 2365 ශ්‍රීලංනාහ
39. මධ්‍ය නිලධාරී රණසිංහ ආරච්චිගේ චාමර ධනුෂ්ක රණසිංහ, එන්ආර්එක්ස් 2366, ශ්‍රීලංනහ
40. මධ්‍ය නිලධාරී හේරත් මුදියන්සේලාගේ නලින් මාධව හේරත්, එන්ආර්එක්ස් 2368, ශ්‍රීලංනාහ
41. මධ්‍ය නිලධාරී ඉසුරු සඳරුස් හෙට්ටිආරච්චි, එන්ආර්එක්ස් 2370, ශ්‍රීලංනාහ
42. මධ්‍ය නිලධාරී ඒකනායක මුදියන්සේලාගේ රොෂාන් ප්‍රදීප් ඒකනායක, එන්ආර්එක්ස් 2371, ශ්‍රීලංනාහ
43. මධ්‍ය නිලධාරී එදිරිච්චාරිගේ ශමීර ලක්ශ්‍රී, එන්ආර්එක්ස් 2372, ශ්‍රීලංනාහ
44. මධ්‍ය නිලධාරී සුපුන් ලක්මාල් වික්‍රමසිංහ, එන්ආර්එක්ස් 2373, ශ්‍රීලංනාහ
45. මධ්‍ය නිලධාරී මධුශංක වියත් යාපා ජයසිංහ, එන්ආර්පී 2374, ශ්‍රීලංනාහ
46. මධ්‍ය නිලධාරී වලිමුණි වලව්වේ ප්‍රභාත් මිලින්ද බණ්ඩාර දෙහිගම එන්ආර්පී 2375, ශ්‍රීලංනාහ
47. මධ්‍ය නිලධාරී හිද්දාදුර වාලුක අයස්මන්ත ලංකාපුර මෙන්ඩිස් එන්ආර්පී 2376, ශ්‍රීලංනාහ
48. මධ්‍ය නිලධාරී රයිගම් බණ්ඩාරනායක මුදලිගේ සක්විති රයිගම්බණ්ඩාර එන්ආර්පී 2377, ශ්‍රීලංනාහ
49. මධ්‍ය නිලධාරී ජයකොඩි ආරච්චිල්ලාගේ ප්‍රදීප් සම්පත් ජයකොඩි එන්ආර්පී 2378, ශ්‍රීලංනාහ
50. මධ්‍ය නිලධාරී හේරත් මුදියන්සේලාගේ දූෂාන් චලින්ද හේරත්, එන්ආර්පී 2379, ශ්‍රීලංනාහ
51. මධ්‍ය නිලධාරී වීරසිංහ ආරච්චිගේ අමිත් දර්ශන වීරසිංහ එන්ආර්පී 2380, ශ්‍රීලංනාහ
52. මධ්‍ය නිලධාරී රත්නායක මුදියන්සේලාගේ සහාන් රුවින්ද ආරියසේන එන්ආර්එස් 2381, ශ්‍රීලංනාහ
53. මධ්‍ය නිලධාරී මද්දුම පටබැඳිගේ චානක ප්‍රභාෂන හේමචන්ද්‍ර, එන්ආර්එස් 2382, ශ්‍රීලංනාහ
54. මධ්‍ය නිලධාරී ලක්ෂිත දිල්රුක් සේරසිංහ, එන්ආර්එස් 2383, ශ්‍රීලංනාහ
55. මධ්‍ය නිලධාරී තරිඳු දනුංජය මීමැඩුම, එන්ආර්එස් 2384, ශ්‍රීලංනාහ
56. මධ්‍ය නිලධාරී ලක්දුව කොවිස්ලාගේ චාමර මීරාල් පෙරේරා, එන්ආර්එස් 2385, ශ්‍රීලංනාහ
57. මධ්‍ය නිලධාරී සපුමල් අනුරුද්ධ කුමාරනායක එන්ආර්එස් 2386, ශ්‍රීලංනාහ

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක හා නාගරික සංවර්ධන අමාත්‍යාංශය.

2008 ජුනි මස 27 වැනි දින,
කොළඹ දී ය.

06-571

2013 අංක 215

D/AF/713.

**ශ්‍රී ලංකා ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2009 අගෝස්තු මස 15 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරියා ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත :

ස්කොඩ්රන් ලීඩර් වනිගමුනි දුමිඳු කිසන්ත මෙන්ඩිස් (01680) කාර්මික/ ඉංජිනේරු

අතිගරු ජනාධිපතිතුමන්ගේ අණ පරිදි,

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක, මහජන ආරක්ෂාව,
නීතිය හා සාමය පිළිබඳ අමාත්‍යාංශය.

2009 ජූලි මස 23 වැනි දින,
කොළඹ දී ය.

06 - 460

2013 අංක 216

D/AF/797.

**ශ්‍රී ලංකා නිත්‍ය ගුවන් හමුදාව**

අතිගරු ජනාධිපතිතුමා විසින් අනුමත කරන ලද විශ්‍රාම ගැනීමක්

2011 ජනවාරි මස 01 වැනි දින සිට පහත නම සඳහන් නිලධාරිණිය ශ්‍රී ලංකා ගුවන් හමුදාවෙන් විශ්‍රාම ගන්නවා ඇත :

ස්කොඩ්රන් ලීඩර් එදිරව්වාරිගේ රශිකා රෝෂිනී ජිනදාස (ඕ ඩබ්ලිව්/01028) කාර්මික ඉංජිනේරු

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි

ගෝඨාභය රාජපක්ෂ, ආර්ඩබ්පී, ආර්එස්පී, පීඑස්සී,
ලේකම්,
රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය.

2010 අගෝස්තු මස 18 වැනි දින,
කොළඹ දී ය.

06-459

# වෙනත් පත්කිරීම් ආදිය

ඇමුණුම 'අ'
2013 මැයි මස 28 වැනි දිනැති
අංක : නාහ. 121/947 දරන
නාවික හමුදාධිපතිගේ ලිපිය

**ශ්‍රී ලංකා නාවික හමුදාව - නිත්‍ය නාවික බලකාය**

අවමන් සහිතව නාවික හමුදා සේවයෙන් පහකිරීමක්

ශ්‍රී ලංකා නාවික හමුදා නිත්‍ය බලකායේ පහත නම සඳහන් නිලධාරියා 2013 මැයි මස 08 වැනි දින සිට අවමන් සහිතව නාවික හමුදා සේවයෙන් පහ කෙරේ :

උප ලුතිතන් රෝෂන් සන්ජේ හපුආරච්චි, එන්ආර්එක්ස් 0698, ශ්‍රීලංනාහ.

ජේඑස්කේ කොලඹගේ, ආර්එස්පී, වීඑස්වී, යූඑස්පී, ආර්සීඩීඑස්, පීඑස්සී,
වයිස් අද්මිරාල්,
නාවික හමුදාධිපති.

2013 මැයි මස 28 වැනි දින,
කොළඹ දී ය.

06-365

# රජයේ නිවේදන

**රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව**

විවාහ සිදු කිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර නමැති, ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| අංකය | ලියාපදිංචි කිරීමේ දිනය | විස්තරය | පිහිටීම | දේවගැතිතැන, අයිතිකරු හෝ, භාරකරු | ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද |
|---|---|---|---|---|---|
| 1439 | 2013.05.29 | ශුද්ධ වූ ජෙරාඞ් මජෙල්ලා දේවස්ථානය | පල්ලිය පාර, සපුගහවත්ත දොඩංගොඩ | ගරු නිර්මාල් මාලක සිල්වා පියතුමා | රෝමානු කතෝලික |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 මැයි මස 30 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

06 -359

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ සිදු කිරීම සඳහා දේවස්ථානය ලියාපදිංචි කිරීම

විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ (112 වැනි පරිච්ඡේදය) 10 වැනි වගන්තියේ විධිවිධාන අනුව ඒකනායක මුදියන්සේලාගේ ගුණසේකර නමැති, ලංකාවේ රෙජිස්ට්‍රාර් ජනරාල් වන මම, ප්‍රසිද්ධ ක්‍රිස්තියානි දේවස්ථානයක් හැටියට ප්‍රයෝජනයට ගැනෙන පහත සඳහන් කරනු ලබන ගොඩනැගිල්ල විවාහ සිදු කිරීම සඳහා විධි වූ පරිදි ලියාපදිංචි කර තිබෙන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| අංකය | ලියාපදිංචි කිරීමේ දිනය | විස්තරය | පිහිටීම | දේවගැතිතැන, අයිතිකරු හෝ, භාරකරු | ගොඩනැගිල්ල ලියාපදිංචි කරනු ලැබ ඇත්තේ කුමන ආගමක් වෙනුවෙන් ද |
|---|---|---|---|---|---|
| 1437 | 2013.04.04 | ශුද්ධ වූ මිබායෙල් අග්‍රදූතතුමන්ගේ දේවස්ථානය | එස්. ටී. එෆ්. පාර, නාගොඩ කළුතර | ගරු නිර්මාල් මාලක සිල්වා පියතුමා | රෝමානු කතෝලික |

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2013 අප්‍රේල් මස 10 වැනි දින,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/A3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.

06 -506

---

### 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම් දීම

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත 1959 අංක 5 දරන ආඥාපනත 1964 අංක 24 දරන පනත 1973 අංක 41 දරන පනත 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත්වලින් සංශෝධිත 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත අංකයක් ඉදිරියේ දක්වා ඇති ණයකරු ණයහිමි යන දෙපක්ෂයම අතරේ බේරුමක් ඇති කිරීමට ප්‍රයත්නයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර ඇති බව දන්වමින් 2013 මාර්තු මස 01 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරන ලද පහත සඳහන් දැන්වීම අවලංගු කරන ලද බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

| ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම හා ලිපිනය | ණයහිමිගේ නම සහ ලිපිනය |
|---|---|---|
| 07<br>42494 | රණසිංහ කංකානමලාගේ අයිරාංගනී<br>රණසිංහ මිය,<br>අංක 82,<br>කිඹුල්ගොඩ.<br>යක්කල. | සම්පත් ෆිනෑන්ස් ඇන්ඩ් ඉන්වෙස්ට්මන්ට් කම්පැණි ලිමිටඩ්,<br>අංක 60,<br>නුවර පාර,<br>කිරිබත්ගොඩ. |

ටී. කේ. රත්නසූරිය,
ලේකම්, (වැඩ බලන)
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

2013 ජූනි මස 07 වැනි දින,
අංක 80,
අධිකරණ මාවත,
කොළඹ 12.

06-566

---

**1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත**

අංක 25/26 වැනි වගන්තිය යටතේ දැනුම්දීම

වර්ෂ 1941 අංක 40 දරන ආඥාපනත 1959 අංක 5 දරන ආඥාපනත, 1964 අංක 24 දරන පනත, 1973 අංක 41 දරන පනත, 1978 අංක 19 දරන පනත ආදී සංශෝධන පනත් වලින් සංශෝධිත 1941 අංක 39 දරන ණය සහනදායක ආඥාපනත යටතේ පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් ඉල්ලුම්පත අංකයක් ඉදිරියේ දක්වා ඇති ණයකරු ණයහිමි යන දෙපක්ෂය අතර බේරුමක් ඇති කිරීමට ප්‍රයන්තයක් දැරීමට ණය සහනදායක මණ්ඩලය අදහස් කර තිබේ.

මේ සම්බන්ධයෙන් මෙහි පහත සඳහන් ණයකරුවන්ගෙන් තමන්ට අයවිය යුතු ණය තුරුස් පිළිබඳ විස්තර ප්‍රකාශයක් තම තමන්ට පැමිණීමට දන්වා ඇති දිනට පෙර මෙම මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලෙස අදාළ ණය හිමියන් වෙත ආඥාපනතේ 25(1) 26(1) වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙනු ලැබේ.

ටී. කේ. රත්නසූරිය,
ලේකම්, (වැඩ බලන),
ණය සහනදායක මණ්ඩලයීය දෙපාර්තමේන්තුව.

අංක 80, අධිකරණ මාවත,
කොළඹ 12,
2013 ජූනි මස 07 වැනි දින.

| ඉල්ලුම්පත් අංකය | ණයකරුගේ නම සහ ලිපිනය | ණයහිමිගේ නම සහ ලිපිනය |
|---|---|---|
| 01<br>42637 | සුභාෂිණී සෙනෙවිරත්න<br>රණවිරු ජයලත් ජයසිංහ මාවත,<br>පාලයන්ගොඩ,<br>බෝම්බුවල,<br>කළුතර | වීරක්කොඩි ආරච්චිගේ නිමල්<br>"නිලාරා"<br>ජයවර්ධන මාවත,<br>මතුගම පාර,<br>දොඩම්ගොඩ,<br>නාගොඩ,<br>කළුතර. |
| 02<br>42531 | වීරහැන්නදිගේ පියල් හේමචන්ද්‍ර ප්‍රනාන්දු,<br>අංක 66/25,<br>3 වැනි පටුමග,<br>කොරළවැල්ල,<br>මොරටුව | හේවා ෆොන්සේකාගේ නිහාල් සුසන්ත ෆොන්සේකා<br>අංක 66/33,<br>කොරළවැල්ල,<br>මොරටුව. |
| 03<br>42674 | දේවතා පේඩිගේ මෙන්ඩිස්<br>දඹුල්ල පාර,<br>සමන්පුර,<br>කුරුණෑගල. | දේවතාපේඩිගේ චම්පා ප්‍රියදර්ශනී<br>කහටගස්වල,<br>දඹුල්ල පාර,<br>කුරුණෑගල. |

| *ඉල්ලුම්පත් අංකය* | *ණයකරුගේ නම සහ ලිපිනය* | *ණයහිමිගේ නම සහ ලිපිනය* |
|---|---|---|
| 04<br>42638 | වර්ණකුල ආරච්චිලාගේ ජූඩ් රාජු<br>බැටිසන්<br>අංක 25,<br>ඉහල ඉදිබැද්ද,<br>මොරටුව | ප්‍රැන්සිස්කුහෙට්ටිගේ නදීස් මධුසංක<br>සිල්වා<br>අංක 3/29බී,<br>සේවා පටුමග,<br>ඉහල ඉදිබැද්ද,<br>මොරටුව. |
| 05<br>42600 | අබ්දුල් සතාර් ෂේක් මොහොමඩ්<br>සපුර්ඩීන්<br>අංක 18/4,<br>කාන් ගාර්ඩින්ස්,<br>පොල්ගහවෙල. | උඩුමුල්ලලාගේ චන්ද්‍රාවතී<br>කම්බිකොටුව<br>දෙනගමුව,<br>පොල්ගහවෙල. |
| 06<br>42529 | ලොකුබෝගහවත්තගේ දයානන්ද<br>අංක 185/13/1,<br>මොගොඩ කොළොන්නාව,<br>කොළොන්නාව. | මුතුතන්ත්‍රිගේ රොෂාන් චම්පික කුරේ<br>අංක 263/2,<br>කෝන්ගහවත්ත,<br>උස්වත්ත, වැල්ලම්පිටිය. |
| 07<br>41382 | සුදුහකුරුගේ සෝමාවතී<br>ගිනිදමන,<br>පත්බේරිය,<br>පරකඩුව | අලුතගම ඇතිරාලලාගේ සුගත්<br>වීරසිංහ,<br>බෙන්දළුව,<br>පරකඩුව. |
| 08<br>42618 | රණසිංහ ආරච්චිගේ යමුනා පෙරේරා<br>අංක 353/3,<br>මාකොළ උතුර,<br>මාකොළ. | පිගමගේ විජිත් උදයසිරි<br>අංක 359/බී,<br>ඇටකොරස,<br>රාගම. |
| 09<br>42615 | මොහම්මදු දීන් සිත්ති ආයිසා<br>අංක 181/3,<br>ගනිතපුර,<br>වරකාපොල | ඒකනායක ආරච්චිලාගේ ලාල්<br>චන්ද්‍රසේන,<br>තාඹුගල,<br>දංඕවිට.<br><br>2. වීරමුත්තු වසන්තා දේවි<br>පැණිහෙලවත්ත,<br>වේවැල්දෙනිය. |

06-567

---

මගේ අංකය : ආර්ජී/එන්බී/11/2/20/2013/පිටු/සැ.

**ඉඩම් ලියාපදිංචිකිරීමේ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනත**

මෙහි පහත උපලේඛනයෙහි දෙවැනි තීරුවේ සඳහන් ඉඩම් සහ තුන්වැනි තීරුවෙහි සඳහන් ඔප්පුවලට අදාළ පළමු වැනි තීරුවේ දැක්වෙන දැනට කැඩී බිඳී ගොස් ඇති ඉඩම් ලියාපදිංචි කළ පොත්/පිටුව නැවත සම්පූර්ණව තාවකාලිකව සකස් කර ඇති බැවි ඉඩම් ලියාපදිංචි කළ පොත්වල නැවත සකස් කළ පිටු පිළිබඳ (120 අධිකාරය) ආඥාපනතේ 4 වැනි වගන්තිය අනුව මෙයින් දැනුම් දෙමි.

02. වර්ෂ 2013.06.21 වැනි දින සිට 2013.07.05 වැනි දින දක්වා සතියේ වැඩ කරන දිනවල පෙ. ව. 10.00 සිට ප. ව. 3.00 දක්වා ඕනෑම අයෙකුට ඉහත කී තාවකාලික පිටුව දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ දී පරීක්ෂා කර බැලිය හැකි ය.

03. එම තාවකාලික පිටුවේ කිසියම් හෝ එවැනි සටහනක අඩංගු යම් කරුණක් පිළිබඳව යම් විරුද්ධත්වයක් ප්‍රකාශ කර සිටීමට කැමති කෙනෙකු විසින් හෝ යම් සටහනක් හෝ යම් කිසි සටහනකින් අතහැර දමන ලද කරුණක් අඩංගු කරවා ගැනීමට ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට කැමති

කෙනෙකු විසින් එකී විරුද්ධතාවය හෝ ඉල්ලීම අඩංගු ලියවිල්ලක් සවිස්තරාත්මකව පැහැදිලිව එය තහවුරු කෙරෙන ලියවිලි සමග 2013.07.12 දිනට පෙර මෙහි පහත අත්සන් කළ අයට ලැබෙන සේ රෙජිස්ට්‍රාර් ජනරාල් කාර්යාලය වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
අංක 234/ඒ3, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
බත්තරමුල්ල.
ප්‍ර.තො.11/2/09/2009/පිටු/සැ.

*උපලේඛනය*

| *ලියාපදිංචි කළ පොත්වල කැඩී බිඳී ඇති පිටුවල විස්තර* | *ඉඩම්වල විස්තර* | *ලියාපදිංචි කළ ඔප්පුවල විස්තර* |
|---|---|---|
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් දරන කොට්ඨාසයේ 1101 වෙළුමේ 118 පත්‍රිරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළයේ, රත්මලාන පිහිටි "කඳවල වතුයාය කොටසක් " නමැති ඉඩමේ අංක 91 දරන කැබැල්ලට එස්. අම්බලවාන මානක තැන විසින් 1952.12.25 වැනි දින මැන සාදන ලද අංක 33 දරන පිඹුරට ප්‍රකාර මායිම් :<br>*උතුරට* : ලොට් 73,<br>*නැගෙනහිරට* : ලොට් 92,<br>*දකුණට* : ලොට් 90<br>*බස්නාහිරට* : ලොට් 83 (පාර)<br>*ප්‍රමාණය* : අ. 0, රූ. 1, පර්. 0 | 1. එස්. විශ්වලිංගම් ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1975.01.17 වැනි දින අංක 13420 දරන තෑගි ඔප්පුව<br>2. එස්. විශ්වලිංගම් ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1979.09.06 වැනි දින අංක 14683 දරන ප්‍රකාශන ඔප්පුව<br>3. ඩී. බී. ඩී. ද සිල්වා ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1979.09.11 වැනි දින අංක 431 දරන විකුණුම් ඔප්පුව |
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් දරන කොට්ඨාසයේ 1308 වෙළුමේ 08 පත්‍රිරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළයේ, කඳවල සෙන්ටර් පාරේ පිහිටි වරිපනම් අංක 10 දරන "කන්දවත්ත ඇස්ටේට්" නමැති ඉඩමේ අංක 02 දරන කැබැල්ලට එච්. රාජපක්ෂ මානත තැන විසින් 1979.12.12 වැනි දින මැන සාදන ලද අංක 79/34 දරන පිඹුරට ප්‍රකාර මායිම් :<br>*උතුරට* : සෙන්ටර් පාර,<br>*නැගෙනහිරට* : වරිපනම් අංක 14, සෙන්ටර් පාර, රත්මලාන<br>*දකුණට* : වරිපනම් අංක 10/1, දෙවන හරස් වීදිය, දෙවන පටුමග, රත්මලාන<br>*බස්නාහිරට* : ලොට් 01<br>*ප්‍රමාණය* : අ. 0, රූ. 0, පර්. 19.07 | 1. කේ. තිරුවාරුවල්ලාල් ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1981.04.10 වැනි දින අංක 250 දරන උකස් ඔප්පුව<br>2. එස්. ජේ. එල්. ස්ටැනිස්ලස් ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1983.01.12 වැනි දින අංක 225 දරන උකස් ඔප්පුව<br>3. එල්. එච්. එල්. එම්. පී. හරදාස ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1987.07.16 වැනි දින අංක 93 දරන උකස් ඔප්පුව |
| කොළඹ දිස්ත්‍රික්කයේ, දෙල්කඳ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ එම් දරන කොට්ඨාසයේ 1308 වෙළුමේ 248A පත්‍රිරුව | බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, පල්ලේ පත්තුවේ, සල්පිටි කෝරළයේ, කඳවල සෙන්ටර් පාරේ පිහිටි වරිපනම් අංක 10 දරන "කන්දවත්ත ඇස්ටේට්" නමැති ඉඩමේ අංක 02 දරන කැබැල්ලට එච්. රාජපක්ෂ මානක තැන විසින් 1979.12.12 වැනි දින මැන සාදන ලද අංක 79/34 දරන පිඹුරට ප්‍රකාර මායිම් :<br>*උතුරට* : සේනටර් පාර,<br>*නැගෙනහිරට* : වරිපනම් අංක 14, සෙන්ටර් පාර, රත්මලාන<br>*දකුණට* : වරිපනම් අංක 10/1, දෙවන හරස් වීදිය, දෙවන පටුමග, රත්මලාන<br>*බස්නාහිරට* : ලොට් 01<br>*ප්‍රමාණය* : අ. 0. රූ. 0, පර්. 19.07 | 1. වී. මුරුගේසු ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1987.08.31 වැනි දින අංක 2347 දරන බලය පැවරීමේ ඔප්පුව<br>2. එම්. වික්‍රමරත්න ප්‍රසිද්ධ නොතාරිස් විසින් ලියා සහතික කරන ලද 1988.11.19 වැනි දින අංක 649 දරන විකුණුම් ඔප්පුව |

06 - 572

### 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනත

1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ 22 වැනි වගන්තියෙන් විෂය භාර අමාත්‍යවරයාට පැවරී ඇති බලතල යටතේ නිකුත් කරනු ලබන නියෝග.

බන්දුල ගුණවර්ධන,
අධ්‍යාපන අමාත්‍ය,

2013 මැයි මස 30 වැනි දින,
කොළඹ දී ය.

01. මෙම නියෝග 1968 අංක 25 දරන ප්‍රසිද්ධ විභාග පනතේ නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

02. විභාග කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වනු ලබන-

(i) ජනප්‍රිය පාසල්වලට සිසුන් තෝරාගැනීම සහ ශිෂ්‍යාධාර ප්‍රදානය කිරීමට 5 වැනි ශ්‍රේණියේ සිසුන් සඳහා පවත්වන විභාගය
(ii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගය
(iii) අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය

ආරම්භක දිනට පූර්වයෙන් වූ දින 5 කට පෙර සිට විභාගය අවසන් වන දින දක්වා සම්පූර්ණ කාලය තුළ එම විභාග අපේක්ෂකයන් සඳහා උපකාරක පන්ති සංවිධානය කිරීම, එම පන්ති මෙහෙයවීම, විෂයානුබද්ධ දේශන, සම්මන්ත්‍රණ, වැඩමුළු පැවැත්වීම, එම විභාග සඳහා අනුමාන ප්‍රශ්න ඇතුළත් ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීම, ඒවා බෙදාහැරීම, විභාග ප්‍රශ්න පත්‍රවල ප්‍රශ්න ලබා දෙන බවට හෝ ඒ හා සමාන ප්‍රශ්න ලබා දෙන බවට පෝස්ටර්, බැනර්, අත්පත්‍රිකා, විද්‍යුත් හෝ මුද්‍රිත මාධ්‍ය මගින් ප්‍රසිද්ධ කිරීම හෝ එවැනි දෑ ළඟ තබා ගැනීම සපුරා තහනම් ය. යම් අයෙක් හෝ ආයතනයක් හෝ වෙනත් පාර්ශවයක් මෙකී නියෝග නොසලකා ක්‍රියා කරනු ලැබුවහොත් ඒ තැනැත්තා හෝ ආයතනය හෝ එම පාර්ශවය මෙම පනත යටතේ වරදකරුවෙකු වන්නේ ය.

බන්දුල ගුණවර්ධන,
අධ්‍යාපන අමාත්‍ය.

අධ්‍යාපන අමාත්‍යාංශය,
ඉසුරුපාය,
පැලවත්ත, බත්තරමුල්ල.

06-367

---

# විවිධ දෙපාර්තමේන්තු දැන්වීම්

පීවී 66775.

### 2007 අංක 07 දරන සමාගම් පනත

394 (3) වගන්තිය යටතේ "සෙට්ලොජික් ඇසෝෂියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2009.01.15 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "සෙට්ලොජික් ඇසෝෂියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "සෙට්ලොජික් ඇසෝෂියේට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2013 මැයි මස 23 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

06-373

පීවී 21751.

### 2007 අංක 07 දරන සමාගම් පනත

394 (3) වගන්තිය යටතේ "සෙල්ට් ඉංජිනියරිං (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

1982 අංක 17 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2005.07.14 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "සෙල්ට් ඉංජිනියරිං (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතුන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "සෙල්ට් ඉංජිනියරිං (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම, 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2013 මැයි මස 23 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

06-374

පීවී 62112.

**2007 අංක 07 දරන සමාගම් පනත**

394 (3) වගන්තිය යටතේ "ඩී වුඩ් එන්ටර්ප්‍රයිසස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්" හි නම කපා හැරීමේ දැන්වීම

2007 අංක 07 දරන සමාගම් පනත විධිවිධාන යටතේ 2007.11.21 වැනි දින සංස්ථාපිත සමාගමක් වන "ඩී වුඩ් එන්ටර්ප්‍රයිසස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්" ව්‍යාපාරික කටයුතුවල නිරත නොවන බව නැතහොත් ක්‍රියා විරහිත වී ඇති බව විශ්වාස කිරීමට ප්‍රමාණවත් හේතූන් තිබෙන හෙයින්,

එසේ නොකිරීමට හේතු නොදැක්වුවහොත්, අද දින සිට තෙමසක් ඉකුත්වූ විට, "ඩී වුඩ් එන්ටර්ප්‍රයිසස් ඇන්ඩ් ඉන්ඩස්ට්‍රීස් (ප්‍රයිවට්) ලිමිටඩ්" නම මෙම කාර්යාලයේ තිබෙන සමාගම් රෙජිස්ටරයෙන් කපා හරින බවත්, සමාගම විසුරුවා හරින බවත්, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල් (රාජකාරි ඉටුකිරීම) දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන වන මම 2007 අංක 07 දරන සමාගම් පනතේ 394(3) වැනි වගන්තිය යටතේ මෙයින් දැනුම් දෙමි.

දූවලගේ නිහාල් රංජන් සිරිවර්ධන,
සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්,
(රාජකාරි ඉටුකිරීම).

2013 මැයි මස 23 වැනි දින,
අංක 400, ඩී. ආර්. විජේවර්ධන මාවත,
කොළඹ 10,
සමාගම් රෙජිස්ට්‍රාර් දෙපාර්තමේන්තුවේ දී ය.

06-375

---

**නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මුතිය පිළිබඳ දැන්වීම

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 8 වන වගන්තිය ප්‍රකාරව නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2013 අප්‍රේල් මස 29 වන දින පහත සඳහන් යෝජනාව ඒකමතිකව සම්මත කර ගන්නා ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

විමුක්ති ලියනගේ ප්‍රසිද්ධ නොතාරිස් එන්. එස්. කලන්සූරිය විසින් සහතික කරන ලද අංක 1274 සහ 2010 නොවැම්බර් මස 08 දින සහ ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඒ. ආර්. තල්වත්ත විසින් සහතික කරන ලද අංක 108 සහ 2012 ජූලි මස 18 වන දින දරන උකස් බැඳුම්කර මගින්, මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය විමුක්ත ලියනගේ යන අය විසින් ලබා ගන්නා ලද මූල්‍ය පහසුකම් නිසි පරිදි ආපසු ගෙවීම සඳහා ඇපයක් වශයෙන් ඔහු විසින් කොළඹ 02 යූනියන් පෙදෙසේ අංක 242 දරන ස්ථානයේ පිහිටි නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී නමට උකස් කොට ඇපයට තබා ඇති බැවින් ද, ඉහත සඳහන් විමුක්ත ලියනගේ යන අය ඉහත කී බැඳුම්කර මගින් ඇප තබන ලද එකී පහසුකම් මත අයවිය යුතු ගෙවීම් පැහැර හැරීම සිදුකරන ලද බැවින් ද,

රුපියල් හැත්තෑපන්ලක්ෂ හැත්තෑහතරදහස් හයසියහැත්තෑපහකුත් ශත හතළිස්හතක (රු.7,574,675.74) මුදල සහ 1 වන කාලීන ණය පහසුකම් මත 2013 පෙබරවාරි මස 26 වන දිනට හිඟ මුල් මුදල වන රුපියල් හතළිස්ලක්ෂයක (රුපියල් 4,000,000.00) මුදල මත සහ 2 වන කාලීන ණය පහසුකම මත 2013 පෙබරවාරි මස 26 වන දිනට හිඟ මුල් මුදල වන රුපියල් විසිහත්ලක්ෂ අනූපන්දහස් අටසිය හැත්තෑ පහකුත් ශත හැත්තෑපහක (රුපි 2,795,875.75) මුදල මත 2013 පෙබරවාරි මස 27 වන දින සිට එකඟ වූ පරිදි, තවදුරටත් පොළිය ද, සම්බන්ධිත ව්‍යාවස්ථාපිත අයකිරීම්, ප්‍රචාරක වියදම් සහ වෙනත් යම් ගාස්තු ප්‍රමාණයන් ද, තදනන්තරව ගෙවා ඇති යම් මුදලක් (වෙතොත්) එම මුදල අඩුකොට අයකර ගැනීම සඳහා මෙහි පහත උපලේඛනයේ සවිස්තරව දක්වා ඇති අයිතිවාසිකම්, දේපළ සහ පරිශ්‍රය කොළඹ ත්‍රිවංක ඇන්ඩ් සේනානායක ඔක්ෂනියර්ස් ආයතනයේ ත්‍රිවංක සී. සේනානායක මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට 1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙන් පැවරී ඇති බලතල යටතේ මෙයින් යෝජනා සම්මත කරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළේ, පල්ලේ පත්තුවේ, තලවතුගොඩ පිහිටි සිරිනන්ද ජෝතිකාරාම මාවතේ වරිපනම් අංක 40/3 දරන, ගොඩැල්ලලන්ද නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඒ. පී. දැරනියගල විසින් මැන සාදන ලද අංක 652 සහ 1991 නොවැම්බර් මස 22 වන දින දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන් කළ කැබලි අංක 1 දරන බිම් කොටසට මායිම්, උතුරට : එම්. බී. පීරිස් යන අය හිමිකම් කියන ඉඩම ද, නැගෙනහිරට : එම්. කේ. වී. පීරිස් යන අය හිමිකම් කියන ඉඩම ද, දකුණට : කැබලි අංක 2, 3 සහ 4 ද, බස්නාහිරට : අංක 341 දරන පිඹුරේ කැබලි අංක B[1] ද යන මායිම් තුළ පිහිටි ඉහත කී අංක 652 දරන පිඹුර අනුව පර්චස් දහතුනකුත් දශම හයක් (අ. 0, රූ. 0, පර්. 13.6) විශාල ඉඩම් කැබැල්ල සහ ඒ මත පිහිටි ගහකොළ, පලතුරු ආදී සෑම සියලු දේත් සමගය. මෙම දේපළ හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C85/101 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

තව ද බලයලත් මිනින්දෝරු ඒ. පී. දැරනියගල විසින් මැන සාදන ලද අංක 652 සහ 1991 නොවැම්බර් මස 22 දින දරන පිඹුර ප්‍රකාර කැබලි අංක 3 මාර්ග අයිතිය ද සමඟ ය. මෙය හෝමාගම ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ C85/102 දරන වෙළුමේ/පත් ඉරුවේ ලියාපදිංචි කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

තේජා සිල්වා,
සමාගම් ලේකම්.

අංක 242,
යූනියන් පෙදෙස,
කොළඹ 02.

06-360

**යූනියන් බෑන්ක් ඔෆ් කළම්බු පීඑල්සී**
**(කලින් යූනියන් බෑන්ක් ඔෆ් කළම්බු ලිමිටඩ්)**

යූනියන් බෑන්ක් ඔෆ් කළම්බු පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කරගන්නා ලද යෝජනා සම්මතය

ගැණුම්කරු : මිහිඳුකුලසූරිය ජෝසප් මෙරිල් ප්‍රනාන්දු, අංක 339/බි, මැද පිටිපන, මීගමුව.

ප්‍රසිද්ධ නොතාරිස් ජී. ඒ. එල්. පී. ධම්මික සිල්වා විසින් සහතික කරන ලද අංක 1194 සහ 2009 ජූලි මස 24 දින දරන බැඳුම්කරයේ බලය ප්‍රකාරව යූනියන් බෑන්ක් ඔෆ් කළම්බු පීඑල්සී වෙත උකසට තබන ලද නිශ්චල දේපළ, බලයලත් වෙන්දේසිකරු අයි. ඩබ්ලිව්. ජයසූරිය මහතා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණිය යුතු බවට 2013 මැයි මස 31 වන දින පවත්වනලද යූනියන් බෑන්ක් ඔෆ් කළම්බු පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේ දී යෝජනා සම්මත කරන ලදී.

එහෙයින්, 2010 දෙසැම්බර් මස 06 දිනැති යෝජනා සම්මතය මගින් බලයලත් වෙන්දේසිකරු හේමචන්ද්‍ර දළුවත්ත මහතාට පවරන ලද බලය මෙයින් අවලංගු කරන අතර, ඒ අනුව 2010 දෙසැම්බර් මස 06 දිනැති ඉහත කී යෝජනා සම්මතය මෙහි සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි,

එස්. ඩී. එන්. එස්. කන්නන්ගර,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්.

06-543

---

**ලංකා බැංකුව - වේයන්ගොඩ ශාඛාව**

1968 අංක 34 දරන පනතින් හා 1974 අංක 10 දරන නීතියෙන් සංශෝධනය කරන ලද ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) 21 වැනි වගන්තිය යටතේ කරනු ලබන දැනුම්දීම

2013.05.15 වැනි දින පවත්වන ලද රැස්වීමකදී මෙම බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් විශේෂයෙන්ම හා ඒකමතිකව පහත සඳහන් පරිදි යෝජනා සම්මත කර ගන්නා ලදී.

1. ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඩබ්. ඒ. එස්. පී. විජේවික්‍රම විසින් සහතික කරන ලද 2012.09.04 දිනැති අංක 234 දරන උකස් බැඳුම්කරය මත මුල් මුදල හා 2013.03.18 දින තෙක් පොලිය වශයෙන් රුපියල් පනස් තුන් ලක්ෂ අනූ හත් දහස් එකසිය විසි හතයි ශත එකක (රු.5,397,127.01) මුදල සමග රුපියල් පනස් ලක්ෂයක (රු.50,00,000) මුදල මත වසරකට සියයට විස්සයි දශම පහක (20.5%) බැගින් පොලියක් 2013.03.19 වෙනි දින සිට ගෙවීම නිම කරන දිනය තෙක් මරදගහමුල, මීගමු පාරේ, අංක 293/2 හි සීමාසහිත යානක කන්ස්ට්‍රක්ෂන් ටෙක්නොලොජි පාට්නර්ස් (පුද්ගලික) ආයතනයෙන් (සෙම්බුකුට්ටි ආරච්චිගේ දේවින්ද චන්ද්‍රසිරි ගුණවර්ධන සහ පතිරනගේ ශ්‍රියාණි මංගලිකා මහත්මිය අධ්‍යක්ෂවරු වෙති) අයවිය යුතුව ඇත.

2. ප්‍රසිද්ධ නොතාරිස් එම්. ඩබ්. ඒ. එස්. පී. විජේවික්‍රම විසින් සහතික කරන ලද 2012.09.04 දිනැති අංක 234 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු එකී රුපියල් පනස් තුන්ලක්ෂ අනූ හත් දහස් එකසිය විසි හතයි ශත එකක (රු.5,397,127.01) මුදල සමග 2013.03.19 දින සිට විකිණීමේ දිනය තෙක් ඉහත කී ආකාරයට අය විය යුතු පොලියද, ලංකා බැංකු ආඥා පනතේ 26 වැනි වගන්තිය යටතේ අයකර ගත හැකි ගාස්තු හා මුදල්ද අය කර ගැනීම පිණිස ලංකා බැංකුව වෙත උකස් කරනු ලැබ මෙහි පහත විස්තර කොට ඇති දේපල ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමට කොලොන්නාව, විහාර මාවත, අංක 50/3 හි පදිංචි වෙන්දේසිකාර තුසිත කරුණාරත්න මහතාටද එකී ලංකා බැංකු ආඥා පනතේ (397 අධිකාරය) හා එහි සංශෝධනවල 19 වන වගන්තිය යටතේද, ලංකා බැංකු ආඥා පනතේ 21 වන වගන්තිය යටතේ මෙම යෝජනාවේ දැන්වීම පළ කිරීමට ලංකා බැංකුවේ වේයන්ගොඩ ශාඛාවේ ශාඛා කළමනාකරුට/අයකර ගැනීම් නිළධාරියාටද මෙයින් අවසරදී බලය පවරනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ අලුත්කුරු කෝරළේ, දූනගහපත්තුවේ, කල්පිටිමුල්ල අංක 86/A දරන ග්‍රාම සේවා නිලධාරි කොට්ඨාසයේ, දිවුලපිටිය ප්‍රාදේශීය සභා සීමාව තුළ (දිවුලපිටිය උප කාර්යාලය) සියක්කාර මුල්ලෙහි පිහිටි මාවතබොඩලන්ද නැමති ඉඩමට බලයලත් මිනින්දෝරු ටී. සී. එස්. ප්‍රනාන්දු විසින් සාදන ලද 1969 ජනවාරි 24 සහ 28 දිනැති අංක 898 දරන පිඹුරෙහි ලොට් 7 ලෙස දක්වා සීමා නිර්ණය කොට නිරූපනය කර ඇති බෙදූ ඉඩම් කැබැල්ල එනම් එකී ලොට් 7 උතුරට : එකී පිඹුරෙහි ලොට් 6 ද, නැගෙනහිරට : ලොට් 3 ද, දකුණට : පාරට වෙන් කළ කොටස ද, බස්නාහිරට : පාරද, මායිම්ව එකී අංක 898 දරන පිඹුරට අනුව රූඩ් එකයි පර්චස් හතයි පහෙන් දෙකක (අ. 0, රූ. 1, පර්. 7 2/5) ක බිම් ප්‍රමාණයකින් යුක්තව එහි ඇති සහ වැවෙන ගොඩනැගිලි සහ ගහකොළ ආදී සියළු දේද වේ. මෙය මීගමුව ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ E958/192 හි ලියාපදිංචි කර ඇත.

මේ සමගම එකී ඉඩම සඳහා වූ පාරට වෙන් කළ කොටස භාවිතා කිරීමට ද අයිතිය ඇත.

ලංකා බැංකු අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

ආර්. සී. පතිරත්න මහත්මිය,
ශාඛා කළමනාකරු.

ලංකා බැංකුව,
වේයන්ගොඩ ශාඛාව.

06-450

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.